ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 31 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජනමාධ්‍ය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අවුරුදු 2ත් 15ත් අතර කාල පරාසයක් ඇතුලත අයිතිය අමාත්‍යාංශය වෙත පැවරී ඇති වාහන 26ක වටිනාකම වන රු. 385,150,000 අගය (2024 වර්ෂයේ රක්ෂණය කිරීමේ දී ලබා ගත් තක්සේරු වාර්තා අනුව) මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති මෙතෙක් ගිණුම්ගත නොකළ සියළු වාහන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කඩිනම් පියවර ගනු ලබන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) ඇප ලේඛනය		
මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	ඇප තැබීමට අදාළ කටයුතු සිදු කරමින් පවතන බවත්, ඒ අනුව ඉදිරියේ දී ඇප ලේඛන පවත්වාගනු ලබන බව.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය.

(ii) **හානි පිළිබඳ ලේඛනය**

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	ලේඛනයේ පැවැති අඩුපාඩු හඳුනාගෙන යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය.

(iii) **බැරකම් පිළිබඳ ලේඛනය**

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	බැරකම් ලේඛනයක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා කටයුතු කරනු ලබන බව.	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පෞද්ගලික ආයතන දෙකකින් අය විය යුතු රු.මිලියන 20 ක මුදල වර්ෂ 12 -18 කාලයක සිට හිඟව පැවති අතර ඒවා අය කර ගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	එක් ආයතනයකට හිඟ බදු මුදල් ගෙවන ලෙසට ලිපියක් මගින් දන්වා ඇති අතර, අනෙක් ආයතනයත් හිඟ බදු මුදල් වාරික තුනක් ගෙවා ඇති බවත් ඉතිරිය ගෙවන ලෙසට සිහි කැඳවීම් ද යොමු කර ඇති බවත් පසුවිපරම් කරමින් අයකර ගැනීමට පියවර ගනු ලබන බවත් දන්වා ඇත.	හිඟ ආදායම් රැස් කිරීම සඳහා අදාළ ක්‍රියා මාර්ග නොපමාව ගත යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජනමාධ්‍ය අමාත්‍යාංශය සඳහා රු.432,500,000 ක මූලධන ශුද්ධ මුදල් ප්‍රතිපාදනයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 185,723,029ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මූලධන වියදමෙන් සියයට 57ක් ඉතිරි වී තිබුණි.	Digitalization of Terrestrial Television Broadcasting ව්‍යාපෘතිය අපේක්ෂිත ක්‍රියාකාරි මට්ටමට ළඟා නොවීම, ප්‍රාග්ධන වියදම් ඉතිරියට ප්‍රධාන වශයෙන් හේතු වූ බව.	ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය.
(ආ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම අමාත්‍යාංශයට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු, මුදල් රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවර්තන වැය විෂයයන් 25 කින් පුනරාවර්තන වැය විෂයයන් 04 කට සලසා තිබුණු රු. 10,810,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 06ක් වෙත මාරු කර තිබූ බැවින් මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ ඉහල නංවන ලද ජීවන වියදම් දීමනාව හා විධායක දීමනා ගෙවීමට ප්‍රමාණවත් අතිරේක ප්‍රතිපාදන නොලැබීම, ප්‍රවාහන දීමනාව ඉල්ලුම් කළ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව ඉහළ යාම ආදී කරුණු මත ඒ ඒ වැය විෂයයන් සඳහා මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන සලසා ගන්නා ලද බවත්, රාජ්‍ය මාධ්‍ය සම්මාන උළෙල නොපැවැත් වීම, සූර්ය පැනල භාවිතය මඟින් විදුලි වියදම් අවම කිරීම යන කරුණු අනුව ඒ ඒ වැය විෂයයන්ගේ සිදුවූ ප්‍රතිපාදන ඉතිරිවීම් ඉහත සඳහන් ප්‍රතිපාදන ඌනතා වෙනුවෙන් යොදවන ලද බව.	ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2025 වර්ෂයට අදාළ වැය ලෙජරයේ පෙර වර්ෂයේ බැදීම් හා බැරකම් ලෙස දක්වා ඇති වැය විෂය 1002 - අතිකාල හා නිවාඩු දින දීමනා වල එකතුව රු. 375,689,ක් වුව ද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර තිබූ SA 92 ආකෘතිය අනුව බැරකම් 148,699ක් වූයෙන් රු. 226, 990ක වෙනසක් නිරීක්ෂණය විය.	පාලනය කල නොහැකි අත්‍යාවශ්‍ය වියදම් බැරකම් ප්‍රකාශයේ සටහන් කිරීමෙන් අනතුරුව ගෙවීම් කිරීමට සිදු වූ බවත් ඉදිරියේදී ඉතා පාලනයකින් යුක්තව ගෙවීම් කිරීමට අදාල අංශ දැනුවත් කිරීමට ඉදිරියේ දී පියවර ගන්නා බව.	ඇස්තමේන්තු ප්‍රකාරව වියදම් කළමනාකරණය කර ගත යුතුය.
(ආ)	වැය විෂය 1301 - වාහන නඩත්තු වියදම් යටතේ වූ රු.70,250ක වටිනාකම SA 92හි බැරකමක් ලෙස දක්වා තිබුණද 2025 වැය ලෙජරයේ එය පවත්නා වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.	මෙම වටිනාකම පෙර වර්ෂයේ ගිණුම්ගත බැදිමක් ලෙස බැරකම් ලේඛනයේ ඇතුලත් වන අතර 2025 වැය ලෙජරයේ නිවැරදි කරන ලද බව.	වැය ලෙජරය නිවරැදිව පවත්වා ගත යුතුය.

3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා වන සඵලදායී අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සමාලෝචනය 2024 වර්ෂයට සිදුකර ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත් එම වාර්තාව	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	නොපමාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**නිරීක්ෂණය වටිනාකම රු.**	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශ**
(i)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
	මු.රෙ. 880	-	රජයේ නිලධාරීන් ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු අමාත්‍යාංශයේ නිලධාරීන් 22ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඇප තැබීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බවත් ඉදිරියේ දී ඇප ලේඛන පවත්වා ගනු ලබන බව.	මුදල් රෙගුලාසි හා අදාළ පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**				
	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හා 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන චක්‍රලේඛ	-	අමාත්‍ය කාර්ය මණ්ඩලය තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම සනාථ කළ යුතු බව සඳහන්වුව ද අමාත්‍යවරයා ගේ කාර්යමණ්ඩලයේ නිලධාරීන් 05 දෙනෙක් හා රාජ්‍ය අමාත්‍ය- වරයාගේ කාර්ය මණ්ඩලයේ	අමාත්‍ය කාර්ය මණ්ඩල විසින් අතිකාල/ සංයුක්ත දීමනා ඉල්ලීම ඉදිරිපත් කරන විට එය පෞද්ගලික ලේකම් / සම්බන්ධීකරණ ලේකම් විසින් පරීක්ෂා කර සිය නිර්දේශය ඉදිරිපත් කරන බවත් ඒ මත පදනම්ව	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	නිලධාරීන් 05 දෙනෙකුගේ, 2024 ජනවාරි 01 දින සිට 2024 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. පැමිණීම සනාථ කරන ලේඛන නොමැතිව මෙම නිලධාරීන් වෙනුවෙන් වැටුප්, ප්‍රවාහන දීමනා ඉන්ධන සඳහා රු.13,941,368 අමාත්‍යාංශයෙන් දරා තිබුණි.	පැමිණි බව සනාථ කරන බවත් පෞද්ගලික කාර්ය මණ්ඩලය පැමිණීම/ පිටවීම සනාථ කිරීමට අදාලව නිශ්චිත ප්‍රතිපාදනයන් පිළිබඳ දැනුම් දීමක් මෙතෙක් නොපැවතීම හේතුවෙන් ඉහත පරිදි කටයුතු කර ඇති බවත්, මෙම විමසීම පදනම්ව ඉදිරියේදී පැමිණීමේ පිටවීමේ ලේඛන ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීමට කටයුතු කරනු ලබන බව.	

3.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සේවය හැර ගොස් ඇති නිලධාරියකුගෙන් අය විය යුතු වර්ෂ 01 ඉක්මවූ රු.148,502 ක ණය ශේෂය 2025 පෙබරවාරි 28 දින වන විටත් අය කරගෙන නොතිබුණි.	සේවය හැරගිය මෙම නිළධාරිනිය විසින් වරින්වර අදාල ණය ශේෂය පියවීමට මුදල් ගෙවා ඇති බවත්, ඒ අනුව 2025.04.30 දිනට ණය ශේෂය රු.128,502 ක් බවත් ඉතිරි ණය මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ශ්‍රවණාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 10.75ක ප්‍රතිපාදනයක් සලසා තිබූ අතර 2024 දෙසැම්බර් 31	පාලක මණ්ඩල අනුමැතිය මත එක් කොන්ත්‍රාත්තවක් පිරිනැමීමේ පදනම මත ගොඩනැගිලි දෙපාර්තුමේන්තුව ට වෙත මෙම ව්‍යාපෘතිය පිරි නමා තිබූ බවත්, ඔවුන් විසින් ඉදිරිපත්	සමාලෝචිත වර්ෂයේ දී සැලසුම් කළ කාර්යයන් නියමිත පරිදි ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල කාර්යයන් අධීක්ෂණය කළ යුතුය. වාර්තා නිවැරදිව පවත්වා

	දිනට එම කටයුතුවල ප්‍රගතිය සියයට 100ක් ලෙස දක්වා තිබුණි. නමුත් එහි ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණ ද දෙපාර්තමේන්තුව මෙම කාර්ය ඉටු කිරීම සඳහා බාහිර පාර්ශව වෙත ආරාධනා කර තිබුණේ 2025 පෙබරවාරි 24 දින සිටය.	කරන ලද පිරිවිතර වල අන්තර්ගතයෙහි සිදු වූ වෙනස්කම් මත තීරණ ගැනීමට කල් පමාවක් සිදු වූ බවත්, මේ සම්බන්ධයෙන් පුවත් පත් දැන්වීමේ සිට කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සහ ඉදිකිරීම් කටයුතු එම ආයතනය විසින් සිදු කර මේ වන විට අදාළ ඉදිකිරීම් කාර්යන් සිදු කරගෙන යනු ලබන බවත් දන්වා ඇත.	ගැනීම සඳහා උපදෙස් ලබා දිය යුතුය.
(ආ)	ශ්‍රී ලංකා පදනමේ WiFi පහසුකම් සැපයීම හා ස්ථාපනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 6.8 සඳහා වන ව්‍යාපෘතියේ ප්‍රගතිය ද 2024 දෙසැම්බර් 31 දිනට සියයට 100ක් ලෙස දක්වා ඇතත් එදින වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භකර නොතිබුණි.	ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ පැවති අධික රාජකාරී කටයුතු නිසා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රමාද වන බවත්,මේවන විට අදාළ කාර්යන් සියයට 90 ක් අවසන් කර ඇති අතර සියයට 10 ක ප්‍රමාණයක් Configuration කිරීමට ඉතිරිව ඇති බවත්, ටෙලි කොම් ආයතනයේ සේවකයින් එම කටයුතු වල මේවන විටත් ආයතනය තුළ නියැලෙන බවත්, පදනම් ආයතනය විසින් ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී යම් අඩුපාඩුවක් සිදුවී ඇති බවත් ඉදිරියේදී මේ තත්වය වළක්වා ගෙන කටයුතු කරන බවත් දන්වා ඇත.	සමාලෝචිත වර්ෂයේ දී සැලසුම් කළ කාර්යයන් නියමිත පරිදි ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල කාර්යයන් අධීක්ෂණය කළ යුතුය. වාර්තා නිවැරදිව පවත්වා ගැනීම සඳහා උපදෙස් ලබා දිය යුතුය.

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන ලෙස ප්‍රසම්පාදන සැලසුම් ඉදිරි වසර 3 සඳහා සකස් කිරීමට කටයුතු	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝප-දේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය.

	කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවත් අමාත්‍යාංශය එසේ සිදු කර නොතිබුණි.	කරන ලෙස නිළධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලද බව.	
(ආ)	අමාත්‍යාංශයේ ආරක්ෂක සේවා සපයන ලද සමාගමේ ගිවිසුම් කාලය 2023 අගෝස්තු 31 දින අවසන්ව තිබූ අතර නව ආයතනයක් තෝරා නොගෙන එම සමාගමටම රු. 368,000 මුදලක් දරමින් 2024 අප්‍රේල් 01 දක්වා සේවය ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත් 2024 අප්‍රේල් 01 දින සිට වෙනත් සමාගමක් තෝරා ගෙන තිබූ අතර ගිවිසුම අනුව එම ආයතනයට මසකට උපරිම රු. 276,149 මුදලක් ගෙවීමට ගිවිසුම් ගත වී තිබුණි. මේ අනුව නියමිත කාලය තුළ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් ආයතනය තෝරා නොගැනීම මත අමාත්‍යාංශය මසකට රු.91,851 බැගින් මාස 06ක කාලය සඳහා රු.551,106 අමතර වියදමක් දැරීමට සිදු වී තිබුණි.	සී/ස රක්නා ආරක්ෂක සමාගමේ සේවා ගිවිසුම 2023 අගෝස්තු 31 දිනෙන් අවසන් වීමට ප්‍රථම නව ආයතනයක් තෝරා ගැනීමට ප්‍රසිද්ධ ලංසු කැඳවූ නමුත් අවම ලංසුව ඉදිරිපත් කළ ආයතනය වෙනත් බාහිර කොන්දේසි ඉදිරිපත් කිරීම හේතුවෙන් එම ප්‍රසම්පාදනය අවලංගු කිරීමට කටයුතු කරන ලද බවත්, එවැනි තත්ත්වයක් තුල වෙනත් ආයතනයක් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරිමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බැවින්ද, අමාත්‍යාංශයේ ආරක්ෂක කටයුතු අඛණ්ඩව පවත්වාගත යුතු බැවින්ද රක්නා ලංකා සමාගමේ සේවා ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කරන ලද බවත්, ඉන් පසු නැවත මිල ගණන් කැඳවා ගෝල්ඩන් හාඩ් සිකියුරිටි සර්විස් ආයතනය වෙත ලංසු ප්‍රදානය කරන ලද බවත් ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බවත් දන්වා ඇත.	ගිවිසුම් කාලය අවසන් වීමට පෙර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව විධිමත් පරිදි ලංසු කැඳවීම මගින් ආයතනයක් තෝරා ගත යුතුය.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අංක 32-8985 දරන පෙජරෝ රථය 2022 ජනවාරි 26 දින ජනමාධ්‍ය අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර අදාළ වාහනයේ පළමු අයිතිකරු විසින් ගෙවීමට තිබූ රු.180,000ක හිඟ බලපත්‍ර ගාස්තු වටිනාකමක් හේතුවෙන් ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.ඒ හේතුවෙන් අදාළ වාහනය පවරාගත් දින සිටම ධාවනයට යොදා නොගෙන නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.	මෙම රථය අලුත්වැඩියා කර ධාවනයට සූදානම් කර ආදායම් බලපත්‍ර ගැනීමට කටයුතු කිරීමේදී එහි මුල් අයිතිකරු ගෙවිය යුතු රුපියල් 185,117ක හිඟ ආදායම් බලපත්‍ර ගාස්තුවක් ඇති බව බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් දන්වා ඇති බවත්, එම හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු හා දඩ මුදල් කපා හැරිමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීමක් යොමු කර ඇති බවත්, ආදායම් බලපත්‍ර ලබා ගැනීමට යාමේදී මතු වූ මෙම ප්‍රායෝගික ගැටලුව පිළිබඳව අමාත්‍යාංශය කටයුතු කර ඇති අතර බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබීමට අපේක්ෂිත බව දන්වා ඇත.	වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ආ)	අමාත්‍යාංශයේ ප්‍රවාහන කටයුතු සඳහා අමාත්‍යාංශයට අයිතිය පැවරුණු හා නොපැවරණු වාහන ඇතුළුව වාහන 29ක් පමණ තිබුණ ද 2024 වර්ෂය තුලදී වාහන 19ක් භාවිතාකර තිබුණි. එසේ තිබියදී කල්බදු ක්‍රමයට වාහන 02ක් රුපියල් මිලියන 33කට වර්ෂ5ක කාල පරිච්ඡේදයක් සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය මත ලබා ගෙන තිබූ	අමාත්‍යාංශ සතුව ඇති වාහන පොදුවේ වසර 10ක් ඉක්මවා බැවින් නිතර අලුත්වැඩියාවන්ට යොමු වීමට ඉහළ ප්‍රවණතාව යන් ඇති බවත්, අමාත්‍යාංශ නිලවාහන හිමිකම් ඇති නිලධාරීන්ට අනුයුක්ත කිරීමට සුදුසු වාහන නොතිබූ බැවින්, ඒ වන විටත් එම වාහන අවශ්‍යතාවය සපුරා ගෙන තිබූ ආකාරයටම ජාතික අයවැය චක්‍රලේඛ 07/2022හි විධිවිධාන පරිදි 2023 ජනවාරි	රජයේ වියදම් අවම වන පරිදි නිසි කළමනාකාරීත්වයකින්, රජයේ වියදම් පාලනය පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

	අතර මෙම වාහන 02 වෙනුවෙන් 2024 වර්ෂයේ පමණක් රු. 8,227,326 වියදමක් දරා තිබුණි.	02 දිනැතිව කොම්ට්‍රෝලර් ජෙනරාල්ගේ විධිමත් අනුමැතිය ලබා ගෙන මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන දෙකක් ලබා ගෙන ඇති බවත්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන්ව ඇති බවත් දන්වා ඇත.	
(ඇ)	අමාත්‍යාංශයට විධිමත් ලෙස අයිතිය පවරා නොගත් හා තක්සේරු නොකළ වාහනයක් රු.2,500,000 කට අපහරණය කිරීමට පියවර ගෙන තිබුණි.	වාහනය අපහරණය කිරීමෙන් ලද මුදල කොම්ප්ට්‍රෝලර් ජනරාල් ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස කටයුතු කරන ආදායම් සංකේතාංක 2006-02-01 ට බැර කරන ලද බව.	නිවැරදි ක්‍රමවේදයන්ට අනුකූලව වත්කම් අපහරණය කළ යුතුය.

4.4 අනාර්ජික ගනුදෙනු

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සඳහන් කරන්න.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය 2015 වර්ෂයේදී රු.6,581,432ක වටිනාකම-කට මිලදී ගන්නා ලද ඩී.සී.පී. යන්ත්‍රය 2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 තෙක් ක්‍රියාත්මකව නොපැවතීම නිසා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉදිකර තිබූ රු.56,500,000ක වටිනාකමින් යුතු සිනමාශාලාව මේ දක්වා ක්‍රියාකාරීත්වයට පත් කිරීමට නොහැකිව තිබුණි. මේ අනුව මෙම යන්ත්‍රය ක්‍රියාකාරීත්වයට පත් නොකිරීම මඟින් මණ්ඩලයට ලැබිය යුතුව තිබූ රු.14,765,000 ආදායමක් අහිමි වී තිබුණි.	2024 වර්ෂයේ පළමු කාර්තුව අවසානයේදී අයවැයෙන් අදාළ කාර්යය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා අතිරේක ප්‍රතිපාදන වෙන් කරන ලද බවත්, 2024 වසර අවසානය වන විට එම කාර්යය සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද ආයතනයට නොහැකිවීම නිසා වැඩ නිම කිරීමට නොහැකි වී ඇති බවත් දන්වා ඇති අතර. 2025 අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ වර්තමාන රේඛීය අමාත්‍යාංශය විසින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීමට කමිටුවක් පත් කර ඇති බව.	යන්ත්‍ර නඩත්තු කිරීමේ කටයුතු නොපමාව සිදු කිරීමෙන් සිදු වන අලාභ අවම කිරීමට ක්‍රියා කළ යුතුය.

(ආ)	වටිනාකම රු 14,000,000 වූ ප්‍රවාහන සිවිල් ගුවන් සේවා ආයතනයට අයත් අංක KY – 3328 දරණ ටියානා නිසාන් රථය වෙනුවෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය 2024 වර්ෂය තුළ දී රු.3,042,848ක අලුත්වැඩියා වියදමක් දරා තිබූ අතර මෙය එම වර්ෂය තුළ අමාත්‍යාංශයේ සමස්ත අලුත්වැඩියා වියදමින් සියයට 54කි. මෙවැනි විශාල වටිනාකමකින් යුත් රථ වාහන භාවිතය හා නඩත්තුව වෙනුවෙන් දරන වියදම 2024 ජනවාරි 10 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ අංක 01/2024 හි විධිවිධාන වලට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.	නිලධාරින්ට අනුයුක්ත රජය සතු නිල වාහනයක් බැවින් අළුත්වැඩියා වියදම් දරා ඇති බවත්,01/2024 විධිවිධාන අනුව මාසික කුලී / මෙහෙයුම් කල් බදු මත වාහන ලබා ගැනීමට අවකාශ ඇති නමුත් මේ වන විටත් වාහන 2 ක් ඒ ආකාරයට ලබා ගෙන ඇති හෙයින්, තවදුරටත් එසේ වාහන ලබා ගැනීමෙන් තොරව, මෙම වාහනය අලුත්වැඩියා කර ධාවනයට යොදා ගැනීම සිදු කර ඇති බව.	ජාතික අය වැය චක්‍රලේඛ අංක 01/2024 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	භෞමික රූපවාහිනි විකාශන අංකිතකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පිළිවෙලින් වැය විෂයය අංක 105-02-04-08-2509-12 සහ 105-02-04-08-2509-17 යටතේ ද 2025 වර්ෂයේ දී වැය විෂයය අංක 111-02-28-004-2509-17 යටතේ ද , විගණිත දින වන 2025 අප්‍රේල් 30 දින දක්වා රු.මිලියන 32.7 පමණ වියදමක් දරා තිබුණ අතර මෙම වියදමින් සියයට 99 වැඩි කොටසක් වැටුප් හා වේතන වෙනුවෙන් දරා තිබුණ ද අපේක්ෂිත පරිදි කාර්යභාරයන් ඉටු කර නොතිබුණි.	JICA ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය 2021 වසරේ ආරම්භ වූ අතර 2022 අප්‍රේල් මාසයේ එවකට රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය මත ජපාන රජය විසින් ක්‍රියාත්මක ව්‍යාපෘතින් සඳහා මුදල් සම්ප්‍රේෂණය තාවකාලිකව අත්හිටුවූ බැවින් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු යෝජිත පරිදි කරගෙන යාමට නොහැකි වූ බවත්, මෙම ව්‍යාපෘතියෙහි මූලික කටයුතු කර ගෙන යාමට අවශ්‍ය දෙදෙනෙකුගෙන් සැදුම් ලත් අවම කාර්ය මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද බවත් 2025 මැයි මස 14 වන දින JICA ආයතනය අදාල ගිවිසුම සඳහා එකඟතාවය ලබා දී ඇති බවත්,	අපේක්ෂිත පරිදි ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.

	ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ඉදිරි ව්‍යාපෘති කටයුතු කඩිනමින් කර ගෙන යාමට අවශ්‍ය පියවර මේ වන විට ආරම්භ කර ඇති බවත් දන්වා ඇත.	

4.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශීර්ෂ අංක 105 ජනමාධ්‍ය අමාත්‍යාශය යටතේ ප්‍රතිපාදනය කරන ලද රු.5,643,580ක රථවාහන අළුත්වැඩියා වියදමෙන් රු.3,042,848ක් සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අයත් රථවාහනය අළුත්වැඩියාව වෙනුවෙන් දරා තිබුණි.	මෙම වාහනය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජනමාධ්‍ය අංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය අනුමැතීන් මේ වන විට ලැබී ඇති බවත්, ජනමාධ්‍ය අංශයේ භාවිතයේ පවතින රජයේ වාහනයක් වශයෙන් ධාවන තත්ත්වය පවත්වා ගැනීම පිණිස අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කර ඇති බව.	අමාත්‍යාංශය සතුව හිමිකම පවතින වාහන නඩත්තු කිරීම සඳහා පමණක් ප්‍රතිපාදන භාවිතා කළ යුතුය.